## පිළිකා හඳුනා ගැනීමේ පරීක්ෂාවක් යනු කුමක්ද?

පිළිකා හඳුනා ගැනීමේ පරීක්ෂා මගින් පිළිකාවේ මුල් කාලීන සලකුණු සොයාගත හැකිය. පරීක්ෂා මගින් අනාගතයේදී පිළිකා ඇති කළ හැකි සෛලවල වෙනස්කම් හෝ ඔබේ ශරීරයේ පවතින ආසාදන සොයා ගැනීමට හැකිය.

ආන්ත්‍රික, පියයුරු සහ ගැබ්ගෙල පිළිකාවල මුල් කාලීන ලක්ෂණ හඳුනා ගැනීම සඳහා ඔස්ට්‍රේලියානු රජය ජාතික පිළිකා හඳුනා ගැනීමේ වැඩසටහන් තුනක් පිරිනමයි. පිළිකාවක් මුල් අවධියේ දී සොයා ගතහොත්, නොනැසී සිටීමේ අවස්ථා වැඩි වේ.

**ඔබට කොළ හෝ නිල් Medicare කාඩ්පතක් තිබේ නම්** පිළිකා හඳුනා ගැනීමේ වැඩසටහන් නොමිලේ සැපයේ. ඔබට Medicare කාඩ්පතක් නොමැති නම්, පරීක්ෂණ සඳහා කොපමණ මුදලක් වැය වේද යන්න ගැන ඔබේ GP සමග කතා කරන්න.

## පිළිකා හඳුනා ගැනීමේ පරීක්ෂාවන් මගින් ඔබේ ජීවිතය බේරා ගත හැකිය.

ඔබට ආන්ත්‍රික, පියයුරු හෝ ගැබ්ගෙල පිළිකා හඳුනා ගැනීමේ පරීක්ෂාව පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම්, පිවිසෙන්න

- cancersa.org.au
- breastscreen.sa.gov.au
- wellbeingsa.sa.gov.au/cervicalscreening

පිළිකාවක් ඇති බව හඳුනා ගැනීමෙන් පසු ඔබට සහාය අවශ්‍ය නම්, **13 11 20** ඔස්සේ **Cancer Council SA** අමතන්න.



මෙම සම්පත Wellbeing SA, BreastScreen SA සහ Cancer Council SA මගින් සකස් කර ඇත.

මෙම සම්පත ප්‍රථම වරට 2017 වසරේ CALD Women's Cancer Screening Ambassadors Project (සංස්කෘතික හා භාෂාමය වශයෙන් වෙනස් කාන්තාවන්ගේ පිළිකා හඳුනා ගැනීමේ තානාපති ව්‍යාපෘතිය) තුළ දී ගොඩනගන ලදි.

Government of South Australia
Wellbeing SA

BreastScreen SA

phn COUNTRY SA
An Australian Government Initiative

Cancer Council SA

නොමිලේ* සහ පිළිකා පිළිබඳ රහස්‍ය තොරතුරු සහ සහාය සඳහා, සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 9.00 සිට සවස 5.00 දක්වා:

- Cancer Council අමතන්න **13 11 20**
- **cancersa.org.au වෙතින් මාර්ගගතව චැට් කරන්න**
- ඊමේල්**askanurse@cancersa.org.au**

**131 450** ඔස්සේ භාෂණ පරිවර්තන සේවා නොමිලේ* ලබා ගත හැකිය.

*ප්‍රදේශීය ඇමතුමක ගාස්තුව

2022 දෙසැම්බර් මාසයේදී සමාලෝචනය කරන ලදි

Sinhalese | සිංහල

Cancer Council SA

# පිළිකා පරීක්ෂාව

## පිළිකා කලින් සොයා ගන්නේ කෙසේද



පිළිකා කලින් හඳුනාගැනීම

තොරතුරු හා උපකාර
**13 11 20**
**cancersa.org.au**




# ආන්ත්‍රික පිළිකා පරීක්ෂාව

**ආන්ත්‍රික පිළිකා බොහෝ විට රෝග ලක්ෂණ නොමැතිව වර්ධනය වේ. අන්ත්‍රික පිළිකාවක් මුල් අවධියේ දී සොයා ගතහොත්, දිවි ගලවා ගැනීමේ සම්භාවිතාව වැඩි වේ.**

ආන්ත්‍රික පිළිකා පරීක්ෂාවට මලපහ ආශ්‍රිත ගුප්ත රුධිර පරීක්ෂාවක් (FOBT) සම්පූර්ණ කිරීම ඇතුළත් වේ. FOBT මගින් ඔබේ මලපහවල ඇති නොපෙනෙන රුධිරය සොයයි. රුධිරය සොයා ගතහොත්, එයට හේතුව සොයා ගැනීමට ඔබට වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය විය හැකිය.

සෑම වසර දෙකකට ම වරක් ජාතික ආන්ත්‍රික පිළිකා පරීක්ෂා කිරීමේ වැඩසටහන මගින් අවුරුදු 50-74 වයස්වල පසුවන සියලුම ඔස්ට්‍රේලියානුවන්ට වෙත නොමිලේ FOBT කට්ටලයක් තැපැල් කරනු ලැබේ.

**Cancer Council SA මෙසේ නිර්දේශ කරයි:**

- ඔබට වයස අවුරුදු 50 හෝ ඊට වැඩි නම් සෑම වසර දෙකකට ම වරක් ආන්ත්‍රික පිළිකා පරීක්ෂාවට සහභාගී වන්න
- ඔබට රෝග ලක්ෂණ ඇත්නම් ඔබේ වෛද්‍යවරයා හමුවන්න. රෝග ලක්ෂණවලට ඔබේ ගුද මාර්ගයෙන් ලේ ගැලීම, මලපහ කිරීමෙන් පසු වැසිකිළියේ හෝ වැසිකිළි කඩදාසි මත රුධිරය දැකීම, හෝ පැහැදිලි කළ නොහැකි මලබද්ධය හෝ පාචනය ඇතුළත් වේ.
- ඔබට ආන්ත්‍රික පිළිකා පිළිබඳ පවුල් ඉතිහාසයක් තිබේ නම් ඔබේ වෛද්‍යවරයා හමුවන්න.

**ඔබ වයස අවුරුදු 50-74 අතර නම්, ජාතික ආන්ත්‍රික පිළිකා පරීක්ෂා කිරීමේ වැඩසටහන වෙතින් ඔබේ FOBT කට්ටලය තැපෑලෙන් ලැබුණු පසු එය සම්පූර්ණ කර ආපසු ලබා දීම වැදගත් වේ.**

**Ncsr.gov.auor** වෙත පිවිසෙන්න, නැතහොත් **1800 627 701** ඔස්සේ National Cancer Screening Register අමතා:

- ජාතික ආන්ත්‍රික පිළිකා පරීක්ෂා කිරීමේ වැඩසටහන මගින් ඔබට නොමිලේ FOBT කට්ටලයක් එවන්නේ කවදාදැයි සොයා බලන්න
- ඔබේ FOBT කට්ටලය නැති වී ඇත්නම් හෝ එයට හානි සිදු වී ඇත්නම්, හෝ එය කල් ඉකුත් වී ඇත්නම් ප්‍රතිස්ථාපන පරීක්ෂණයක් ඇණවුම් කරන්න
- ඔබේ භාෂාවෙන් වැඩිපුර සම්පත් බාගත කරන්න.




# පියයුරු පිළිකා පරීක්ෂාව

**පහසුවෙන් දැකිය හැකි රෝග ලක්ෂණ නොමැතිව පියයුරු පිළිකා වර්ධනය විය හැකිය. පියයුරු පිළිකාවක් මුල් අවධියේ දී සොයා ගතහොත්, නොනැසී සිටීමේ අවස්ථාව වැඩි වේ.**

පියයුරු පරීක්ෂාවක් යනු පියයුරු වල එක්ස් කිරණ පරීක්ෂාවක් වේ. නිරන්තර පියයුරු පරීක්ෂා සිදු කිරීමෙන් බොහෝවිට පියයුරු පිළිකාව ඔබට දැනෙන්නට පෙර මෙන්ම එය කුඩා සහ ප්‍රතිකාර කිරීමට පහසු වන අවධියේ දී පියයුරු පිළිකාව ඉක්මනින්ම සොයා ගත හැකිය. රෝග ලක්ෂණ නොමැති කාන්තාවන්ගේ පියයුරු පිළිකා සොයා ගැනීමට දැනට පවතින හොඳම පරීක්ෂණය පියයුරු පරීක්ෂාවයි.

**Cancer Council SA සහ BreastScreen SA ඔබට මෙසේ නිර්දේශ කරයි:**


- ඔබ වයස අවුරුදු 50 සිට 74 දක්වා වයසේ නම් සෑම වසර දෙකකට වරක් BreastScreen SA වෙතින් නොමිලේ පියයුරු පරීක්ෂාවක් සිදුකර ගන්න. ඔබ වයස අවුරුදු 40-49 හෝ 75 සහ ඊට වැඩි නම්, ඔබට නොමිලේ පියයුරු පරීක්ෂාවක් ලබා ගත හැකිය.
- ඔබට වයස අවුරුදු 50 ට අඩු වුවත් කිසියම් වෙනස්කම් තිබේ දැයි බැලීමට ඔබේ පියයුරු නිතරම පරීක්ෂා කරන්න.
- ඔබේ පියයුරුවල යම් වෙනසක් ඔබ දුටුවහොත් හැකි ඉක්මනින් ඔබේ වෛද්‍යවරයා හමුවන්න. වෙනස්කම්වලට ඔබේ පියයුරුවල ගැටිත්තක් හෝ ඔබේ පියයුරු වල ප්‍රමාණයේ හෝ හැඩයේ වෙනසක් ඇතිවීම ඇතුළත් වේ.
- ඔබට පියයුරු පිළිකා පිළිබඳ පවුල් ඉතිහාසයක් තිබේ නම් ඔබේ වෛද්‍යවරයා හමුවන්න.

**නොමිලේ පියයුරු පරීක්ෂාවක් වෙන් කර ගැනීමට 13 20 50 ඔස්සේ BreastScreen SA අමතන්න.**

ඔබට භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් වෙන් කිරීම සිදු කරන විට ඔවුන්ට ඒ බව දන්වන්න.

**breastscreen.sa.gov.au** වෙත පිවිසෙන්න:

- පියයුරු පරීක්ෂාව පිළිබඳ වැඩිදුර විස්තර සඳහා
- ඔබේ භාෂාවෙන් සම්පත් බාගත කර ගැනීමට



# ගැබ්ගෙල පිළිකා පරීක්ෂාව

**නිරන්තරයෙන් සිදු කරන ගැබ්ගෙල පරීක්ෂාව මගින් බොහෝ ගැබ්ගෙල පිළිකා වළක්වා ගත හැකිය.**

දැන් ඔබට ගැබ්ගෙල පරීක්ෂණයක් කර ගත හැකි ක්‍රම දෙකක් තිබේ.

1. යෝනි මාර්ගයෙන් ඔබේ ම සෛල එකතු කිරීම සඳහා දිගු මිටක් ඇති කපු කූරක් භාවිතා කරන ස්වයං එකතු කිරීමේ පරීක්ෂණයක්. ඔබට වෛද්‍ය සායනයේ දී පෞද්ගලිකව මෙම පරීක්ෂණය සිදු කළ හැකිය. එසේ නැත්නම් ඔබේ වෛද්‍යවරයා සමග කලින් සූදානම් කර ඇති අවස්ථාවල දී ඔබට නිවසේ දී පරීක්ෂණය සිදු කළ හැකිය.
2. එහිදී වෛද්‍යවරයෙකු හෝ හෙදියක් විසින් උපකරණයක් ඇතුල් කර ගැබ් ගෙලෙන් සෛල සාම්පලයක් එකතු කරනු ලැබේ.

විකල්ප දෙකම එක හා සමානව ආරක්ෂිත සහ ඵලදායී වේ. ඔබට සුදුසු කුමන විකල්පය දැයි දැන ගැනීමට ඔබේ වෛද්‍යවරයා සමග කතා කරන්න.

ඔබ හමුවීම වෙන් කරන විට පහත දැක්වෙන දේ ගැන සලකා බැලිය හැකිය:

- සායනයේ දී ස්වයං එකතු කිරීම පවතී දැයි අසා බලන්න.
- අය විය හැකි ගාස්තු ගැන අසා බලන්න.
- කාන්තා වෛද්‍යවරියක් හෝ හෙදියක් ඉල්ලා සිටින්න.
- ඔබට අවශ්‍ය නම් භාෂණ පරිවර්තකයෙකු ඉල්ලා සිටින්න.
- ද්විත්ව හමුවීම් වේලාවක් ඉල්ලා සිටින්න.

**Cancer Council SA සහ BreastScreen SA ඔබට මෙසේ නිර්දේශ කරයි:**

- ලිංගික සම්බන්ධතා පවත්වා ඇති වයස අවුරුදු 25-74 අතර ගැබ්ගෙලක් සහිත සියලු ම කාන්තාවන් සහ පුද්ගලයින්, සෑම වසර පහකට ම වරක් ගැබ්ගෙල නිවාරණ පරීක්ෂණයක් සිදු කළ යුතුය.
- වයස අවුරුදු 12-13 අතර දරුවන්ට Human papillomavirus (HPV) එන්නත ගත යුතුය. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ ද්විතීයික පාසල්වල දී හෝ වෛද්‍ය සායනයක දී මෙම එන්නත නොමිලේ ලබා දේ.
- ඔබට අසාමාන්‍ය රුධිර වහනයක් හෝ ලිංගික සංසර්ගයේ දී වේදනාවක් වැනි රෝග ලක්ෂණ ඇත්නම් ඔබේ වෛද්‍යවරයා හමුවන්න.

වැඩිදුර විස්තර සඳහා **wellbeingsa.sa.gov.au/cervicalscreening** වෙත පිවිසෙන්න, නැත්නම් **cancersa.org.au** ඔස්සේ finding cervical cancer early (ගැබ්ගෙල පිළිකා කලින් සොයා ගැනීම) සොයන්න.